SC

# වී වගාව සදහා පොහොර භාවිතය සම්බන්ධයෙන් මූල්‍ය සම්පාදනය

(මහවැලි සී කලාපය ඇසුරෙන්)


ශිෂ්‍යයාගේ නම : ඩී. එම්. පී. දිසානායක

විභාග අංකය : FGS / E / 2000 / 202 / R


2008 අප්‍රේල්

කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ ආර්ථික විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති
පශ්චාත් උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධනයකි.


| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 489 |
| වර්ග අංකය | |

# සාරාංශය

2005 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ සමස්ත වී නිෂ්පාදනයෙන් 37%ක් පමණ මහවැලි යෝජනා ක්‍රමයට අයත් වගා බිම් වලින් ලැබුණු අතර මහවැලි 'සී' කලාපය මගින් පමණක් ජාතික වී නිෂ්පාදනයට සිදුකළ දායකත්වය 6%ක් පමණ විය. මහවැලි සී කලාපය තුළ ජීවත්වන පවුල් 29296 කින් පවුල් 24559ක් වී වගාවේ නිරත වී ඇත. නිදහසින් පසු මේ දක්වා බිහිවූ රජයන් ව්‍යවස්ථා සම්පාදනය, ආයතනිකමය ව්‍යුහයන් ස්ථාපිත කිරීම, වාරිමාර්ග යෝජනා ක්‍රම ඇති කිරීම සහ විවිධ සහනාධාර ක්‍රම ක්‍රියාන්විත කිරීම මගින් වී වගාවේ අභිවෘද්ධිය සඳහා මැදිහත් වී ඇත. එහෙත් වී වගාවේ නිරත වූ ගොවීන් ආර්ථිකමය වශයෙන් පුනර්ජීවයක් ලැබීම වෙනුවට වී වගාව ලාභදායි නොවීම නිසා දරිද්‍රතාවයට සහ ණය ගැති භාවයට හසුවී ඇත. නිෂ්පානය සඳහා ලැබෙන මිළ ගණන්වලට සාපේක්ෂවය නිෂ්පාදන පිරිවැය අඛණ්ඩව ඉහළ යාම නිසා ලාභදායිතාවයට අහිතකර ප්‍රතිඵල ඇති වී තිබේ. නිෂ්පදාන පිරිවැය ඉහළ යෑම සඳහා බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ ඵලදායිතාවය ඉහළ නංවා ගැනීම සඳහා කාබනික පොහොර වෙනුවට රසායනික පොහොර භාවිතය වැඩි කිරීමත්, ජාත්‍යන්තර වෙළඳ පොලේ රසායනික පොහොර මිළ ගණන් ඉහළ යාමත්ය. පොහොර සහනාධාරයකින් තොරව සිදු කරන වී නිෂ්පාදනයේ පිරිවැය ව්‍යුහය තුළ පොහොර සඳහා වන පිරියැව 31%ක් පමණ වේ. මහවැලි සී කලාපය තුළ පොහොර මිලදී ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පාදනය වෙනුවෙන් වී ගොවීන්ට අනුගමනය කළ හැකි ක්‍රම කිහිපයක් ඇත. තම ඉතුරුම් භාවිතය ස්වේච්ඡා සමිතිවලින් ණය ලබාගැනීම, පවුලේ ඥාතීනගෙන් ණය ලබාගැනීම, වෘත්තීය ණය දෙන්නන්ගෙන් අධික පොලියට ණය ගැනීම, විධිමත් මූල්‍ය අංශ්‍යයෙන් ණය ලබාගැනීම සහ තම රන්භාණ්ඩ උකසට තබා ණය ගැනීම ආදි වශයෙන් පවතින මෙම විවිධ ක්‍රම අතුරින් කවර මූලාශ්‍රය ජනප්‍රිය වී ඇත් ද යන්න මෙහිදී අධ්‍යයනයට ලක් කෙරුණි. මහවැලි සී කලාපයේ බතලයාය ප්‍රදේශයේ සිදුකළ සමීක්ෂණයෙන් ලබාගත් තොරතුරු අනුව ගොවීන්ගෙන් 55%ක් වී වගාව සඳහා පොහොර මිළදී ගැනීමට මූල්‍ය සම්පාදනය කරන්නේ රන් භාණ්ඩ උකස් ණය සේවා භාවිතා කිරීමෙනි. තවත් 26%ක් ස්වේච්ඡා සමිති වලින් මේ සඳහා ණය ලබාගන්නා අතර විධිමත් මූල්‍ය අංශයෙන් ණය ලබා ගැනීමට යොමුවන්නේ 2%ක් පමණ සුළු සංඛ්‍යාවකිනි.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.